ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

**අදියර III විභාගය - ජූලි 2021**

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

---

මූල්‍ය පාලනයන් සහ විගණනය විෂයය අනිවාර්ය ප්‍රශ්න 9 කින් සමන්විත වේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 3කින් යුක්තය. **A කොටසට** ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4ක් ද **B කොටසට** ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3ක් ද, **C කොටසට** ලකුණු 25 බැගින් අනිවාර්ය ප්‍රශ්න 2ක් ද ඇතුලත් වේ.

බහුතර අයදුම්කරුවන් ප්‍රමාණයක් ප්‍රශ්න පත්‍රයේ ඇති සියළුම ප්‍රශ්න වලට පිළිතුරු දීමට උත්සාහ කර තිබූ නමුත් සමහර අනු කොටස් වලට පිළිතුරු ලබා දී නොතිබූ අවස්ථාවන් දක්නට ලැබුණි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ දුර්වල කාල කළමණාකරණය, දැනුම හිඟකම සහ ප්‍රශ්න වල අවශ්‍යතාවය පිළිබඳ නිවැරදිව අවබෝධ කර නොගැනීමයි.

## A කොටස

### ප්‍රශ්න අංක 01

ප්‍රශ්නය සම්පූර්ණයෙන් ම පදනම් වී ඇත්තේ සහතික වීමේ කාර්යභාරය ඇසුරින්ය.

ප්‍රශ්නයේ **(a) කොටස** සාධාරණ සහතික වීමේ කාර්යභාරයක් සහ සීමිත සහතික වීමේ කාර්යභාරයක් අතර ඇති වෙනස්කම් පිළිබඳ විභාග අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කරයි.

මෙම කොටස ඉතා සරල සහ ඍජු පිළිතුරු සැපයිය හැකි ප්‍රශ්නයකි. සුළු පිරිසක් හැර අනෙකුත් සියලුම අයදුම්කරුවන් සාමාන්‍ය ලකුණු ලබාගෙන තිබුණි. සමහර අයදුම්කරුවන් **(a) කොටස** සඳහා අදාල නොවන පිළිතුරු සපයා තිබුණි.

ප්‍රශ්නයේ **(b) කොටස** යටතේ ව්‍යවස්ථාපිත විගණනය හැරුණු විට, සහතික වීමේ කාර්යභාරයන් සඳහා උදාහරණ 2ක් සඳහන් කිරීමට අවශ්‍ය විය.

සමහර අයදුම්කරුවන් ව්‍යවස්ථාපිත විගණනය නැවත සඳහන් කර තිබූ අතර ඒ සඳහා ලකුණු ලබා නොදෙන ලදී. විෂයය ට අදාල ස්ව-අධ්‍යයන පාඩම් මාලාවේ උදාහරණ 7 කට වඩා පැහැදිලිව සඳහන් වේ. මෙයින් පෙනී යන්නේ බොහෝ අයදුම්කරුවන් අදාල ස්ව-අධ්‍යයන පාඩම් මාලාව අධ්‍යයනය කිරීමට නිසි සැලකිල්ලක් දක්වා නොමැති බවයි.

මෙම ආකාරයේ ප්‍රශ්න සඳහා ප්‍රමාණවත් ලකුණු ලබා ගැනීමට විභාග අපේක්ෂකයන් පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කරගත යුතුයි:

- සහතික වීමේ කාර්යභාරයක් යනු කුමක්ද?
- විවිධ සහතිකවීමේ කාර්යභාරයන් වර්ග
- සාධාරණ සහ සීමිත සහතිකවීම් අතර වෙනස

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්ය සාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නයේ අරමුණ වූයේ නියෝජ්‍යත්ව න්‍යාය සහ භාරකාරත්ව න්‍යාය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමයි.

අයදුම්කරුවන්ගෙන් බහුතරයක් අවශ්‍යතාව තේරුම් නොගැනීම නිසා නිවැරදි පිළිතුරු ලබා නොදී අඩු ලකුණු ලබාගෙන තිබුණි.

මෙම න්‍යායන් ස්ව-අධ්‍යයන පාඩම් මාලාවේ පැහැදිලිව විස්තර කර ඇත. මෙම න්‍යායික කරුණු හා සබඳතා පිළිබඳව අපේක්ෂකයන්ට පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය. ඊට හේතුව, විගණනය මගින් අධ්‍යක්ෂකවරුන් සමාගමට වඩාත් හිතකර ලෙස ක්‍රියා කරන බව සහ භාරකාර භූමිකාව ඉටු කරන බව කොටස් හිමියන්ට සහතික කිරීමට යාන්ත්‍රණයක් සපයන බැවිනි.

සමහර අපේක්ෂකයන් "නියෝජිතයා යනු විගණකට සහභාගී වීමට නොහැකි විට ඔහුගේ රාජකාරිය ඉටුකරන පුද්ගලයා ය" වැනි අදාල නොවන පිළිතුරු සපයා තිබුණි.

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්ය සාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 03

ව්‍යාපාර සංවිධාන, සිය ව්‍යාපාර කටයුතු කරගෙන යන අතරතුර බොහෝ අභියෝග සහ අවදානම් වලට මුහුණ දෙයි. COVID-19 වසංගතය හේතුවෙන් මෙම අවදානම වැඩි වූ අතර විශේෂයෙන් විනෝද සේවා අංශයට බලපෑම් එල්ල විය.

විනෝද සේවා අංශයේ මෙහෙයුම් සිදු කරන **AB පොදු සමාගමේ** මෙහෙයුම් අවදානම හා අනුකූල වීමේ අවදානම තක්සේරු කිරීමට මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරයි.

කාර්යසාධනය සාමාන්‍ය මට්ටමේ පැවැති අතර දුර්වල කාර්ය සාධනයට හේතු වූයේ:

- මෙහෙයුම් සහ අනුකූල වීමේ අවදානම පැහැදිලි කිරීමට අසමත් වීම.
- අවදානම් මට්ටම තක්සේරු කිරීමට අසමත් වීම.
- නුසුදුසු උදාහරණ ඉදිරිපත් කිරීම.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී භාවිතා කළ හැකිව තිබූ උදාහරණ ලෙස COVID-19 වසංගතය නිසා පැන නැගුණු අගුලු දැමීම, විනිමය පාලනයන්, මුහුණු ආවරණ පැළඳීම, අවශ්‍ය අවම දුර පවත්වා ගැනීම ආදිය දැක්විය හැක.

අභ්‍යන්තර හා බාහිර අවදානම්, අවදානම් කළමනාකරණ රාමුව සහ එම අවදානම් අවම කිරීම සඳහා භාවිතා කරන ශිල්පීය ක්‍රම පිළිබඳ විභාග අපේක්ෂකයන්ගේ දැනුම වැඩි කිරීම සිදු කර ගත යුතුව ඇත.

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමේ නොවීය.**

**ප්‍රශ්න අංක 04**

මෙම ප්‍රශ්නය මගින් එක් එක් කාර්යභාරයේ තත්ව පාලන ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම පරීක්ෂා කරයි. එක් එක් කාර්යභාරයේ තත්ව පාලනය සඳහා සලකා බැලිය යුතු ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි 3 ක් ඇත. එනම්, කාර්යභාර කාර්යසාධනයේ ගුණාත්මකභාවයේ ඒකීයතාවය, අධීක්ෂණය සහ සමාලෝචනය වේ.

මෙම ප්‍රශ්නයේ **(a) කොටස** මගින් කාර්යභාර කාර්යසාධනයේ ගුණාත්මකභාවයේ ඒකීයතාව පවත්වා ගැනීම සඳහා අවධානය යොමුකළ යුතු කරුණු 2ක් සඳහන් කිරීම අවශ්‍ය වේ.

බොහෝ අයදුම්කරුවන් තත්ව පාලනය පිළිබඳව තමන් දන්නා කුමන හෝ ක්‍රියා පටිපාටියක් සඳහන් කර තිබූ අතර ඒ සඳහා ලකුණු වෙන් නොකරන ලදී.
මේ ආකාරයේ ප්‍රශ්න සඳහා ප්‍රමාණවත් ලකුණු ලබාගැනීම සඳහා පහත සඳහන් කරුණු පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය.

- විගණන ආයතනයේ තත්ව පාලන පද්ධතියේ මූලිකාංග
- එක් එක් විගණනය සඳහා අදාල වන තත්ව පාලන අවශ්‍යතා
- තත්ව පාලනයේ එක් එක් අංගයන් සඳහා ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි මෙම ප්‍රශ්නයේ **(b) කොටසේ** විගණන වැඩ සමාලෝචනය කිරීමේදී සලකා බැලිය යුතු කරුණු පරීක්ෂා කර ඇත.

බොහෝ අයදුම්කරුවන් කොටස් 2 ටම පිළිතුරු සැපයීමට උත්සාහ කර සාමාන්‍ය ලකුණු ලබාගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.**

## <u>B කොටස</u>

**ප්‍රශ්න අංක 05**

ආචාරධර්මවලට අනුව හැසිරීම වෘත්තියක ලක්ෂණයක් වන බැවින් විගණකවරයා ආචාරධර්මවල මූලික මූලධර්මයන් ට අනුකූල විය යුතුය.

ප්‍රශ්නයේ **(a) කොටස** මගින් ලබා දී ඇති අවස්ථාවන් ට අදාලව ආචාරධර්මවල මූලික මූලධර්මයන්ට අනුකූලවීමේ තර්ජන 3 ක් පැහැදිලි කිරීම අවශ්‍ය වේ.

බොහෝ අපේක්ෂකයන් දී ඇති සිද්ධියකට අදාල තර්ජන, වෘත්තීය ආචාරධර්ම වල මූලික මූලධර්මයන්ට සම්බන්ධ නොකර පැහැදිලි කර ඇත. සමහර අයදුම්කරුවන් ස්වයං සමාලෝචනය තර්ජනයක් ලෙස හඳුනාගෙන ඇති නමුත් එය ප්‍රශ්නයට අදාල නොවන අතර ලකුණු වෙන් නොකරන ලදී.

ප්‍රශ්නයේ **(b) කොටස** මගින් හඳුනාගත් තර්ජන අවම කිරීම සඳහා **සුරාජ් සහ සමාගම** විසින් ආයතනික මට්ටමින් ගත යුතු ආරක්ෂාවන් සඳහන් කිරීම අවශ්‍ය වේ. ස්ව-අධ්‍යයන පාඩම් මාලාව ආයතනයක් විසින් අනුගමනය කල යුතු බොහෝ ආරක්ෂාවන් දක්වා ඇත. කෙසේ වෙතත්, අයදුම්කරුවන් කිහිපදෙනෙකු නිවැරදිව ආරක්ෂණයන් දක්වා ඇති අතර සමහර අයදුම්කරුවන් එක් එක් කාර්යභාරය ට විශේෂිත ආරක්ෂාවන් සමඟ මිශ්‍රව පිළිතුරු සපයා තිබුණි.

සමස්තයක් ලෙස පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට අපේක්ෂකයන්ට උපදෙස් දෙනු ලැබේ:

- වෘත්තීය ආචාරධර්ම වල මූලිකාංග
- නව සේවාදායකයන් පිළිගැනීමේදී සලකා බැලිය යුතු කරුණු
- මූලික මූලධර්ම වලට අනුකූල වීමට තර්ජන
- තර්ජන අඩුකිරීමට / තුරන් කිරීමට යොදා ගත හැකි ආරක්ෂාවන්
- විගණක ගේ ස්වාධීනත්වය පිළිබඳ සංකල්පය

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නයේ **(a) කොටස** මගින් විගණනය ආරම්භ කිරීමට පෙර මූලික විගණනයට අදාලව විගණන කළමණාකරු විසින් ඉටුකල යුතු නිශ්චිත ක්‍රියා පටිපාටි පැහැදිලි කිරීම අවශ්‍ය වේ. බොහෝ විභාග අපේක්ෂකයන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණි.

කෙසේ වෙතත්, අපේක්ෂකයන්ගෙන් බොහොමයක් මූලික විගණනය පිළිගැනීම සඳහා මෙන්ම මූලික විගණන සැලසුම් කිරීමට අදාල ක්‍රියා පටිපාටි පිළිතුරු ලෙස දක්වා තිබුණි. තවත් සමහර අයදුම්කරුවන් විමසීම්, නිරීක්ෂණයන්, විශ්ලේෂණ ක්‍රියා පටිපාටි, බාහිර තහවුරු කිරීම් වැනි සාමාන්‍ය විගණන ක්‍රියා පටිපාටි සඳහන් කර තිබූ අතර, ඒ සඳහා ලකුණු ලබා නොදෙන ලදී.

මෙම ප්‍රශ්නයේ කාර්යසාධනය සතුටුදායක මටට්ටමක නොපැවතුණි.

ප්‍රශ්නයේ **(b)** හා **(c) කොටස්** විගණන ලේඛනගතකරණය පිළිබඳව වූ අතර කාර්යසාධන සාමාන්‍ය මට්ටමක පැවතුණි .

ප්‍රශ්නයේ **(c) කොටස** සඳහා බොහෝ අපේක්ෂකයන් වැඩ පත්‍රිකා වල ඇතුලත් වන තොරතුරු වෙනුවට විගණකගේ වාර්තාවේ අඩංගු වන තොරතුරු සඳහන් කර තිබුණි. (උදාහරණ:- විගණකගේ නම, ලිපිනය, මතය, අත්සන ආදිය)

අපේක්ෂතයන්ට විගණන ලේඛනගතකරණය පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොතිබූ අතර සාමාන්‍ය කරුණු පිළිතුරු ලෙස ලැයිස්තුගත කර තිබුණි.

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 07

ප්‍රශ්නයේ **(a) කොටස** මගින් **සීමාසහිත රාමා පොදු සමාගමේ** විගණනයෙන් සොයාගත් තොරතුරු වලට අනුව විගණක විසින් කළමණාකාරීත්වයට සහ පාලනය භාරව සිටින පාර්ශවයන් සමග සන්නිවේදනය කළ යුතු කරුණු පැහැදිලි කිරීම අවශ්‍ය වේ. අපේක්ෂකයන් ට ප්‍රශ්නයට අදාල ව දක්වා ඇති කරුණු පැහැදිලි කිරීම් සමඟ නැවත ඉදිරිපත් කිරීම මගින් සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකියාව තිබුණි. මෙම කොටස සඳහා කාර්ය සාධනය සතුටුදායක මට්ටමක පැවති අතර ප්‍රශ්නයේ අවශ්‍යතාව අවබෝධ කර ගැනීමේ දුර්වල හැකියාව සහ පසුගිය ප්‍රශ්න පත්‍ර අධ්‍යයන නොකිරීම හේතුවෙන් අපේක්ෂකයන් කිහිපපෙදනෙකු අඩු ලකුණු ලබාගෙන තිබුණි.

**(b) කොටස**

මෙම කොටස මගින් විගණන සාක්ෂි වලින් ලබා ගන්නා නිගමන ඇගයීමක් මත පදනම් ව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ දැනුම පරීක්ෂා කරයි. විගණන මතය කෙරෙහි සොයා ගැනීම් යටතේ ඇතුලත් කර ඇති කාරණයේ බලපෑම තක්සේරු කළ යුතුය.

SLAS 23 ණය ගැනුම් පිරිවැය අනුව සුදුසුකම් ලබන වත්කම් වලට සෘජුවම ආරෝපණය කළ හැකි ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය කල යුතුය. කෙසේ වෙතත්, එය ආදායම් ප්‍රකාශනය සඳහා සටහන් කර ඇති අතර බලපෑම් මූල්‍ය ප්‍රකාශන වලට ප්‍රමාණාත්මක වේ. එබැවින් විගණකවරයා කළමණාකාරීත්වය සමග මේ පිළිබඳව සාකච්ඡා කළ යුතුය. ගැලපීම් එකඟ නොවන්නේ නම් විගණන මතය ඒ අනුව වෙනස් කළ යුතුය. මෙම කොටස සඳහා කාර්යසාධනය ඉතා දුර්වල විය.

දුර්වල කාර්යසාධනයට හේතුව වූයේ:

- අදාල ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් පිළිබඳ දැනුම නොමැතිකම
- විගණන මතය මත විගණකගේ සොයාගැනීම් වල බලපෑම තක්සේරු කිරීමට ඇති නොහැකියාව
- අදාල මතයක් සැකසීමට ඇති නොහැකියාව
- ප්‍රමාණාත්මකභාවය සහ විගණන මතයට එහි බලපෑම හඳුනාගත නොහැකි වීම

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.**

## C - කොටස

### ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නය සිද්ධි අධ්‍යයනය මත පදනම් වූ ප්‍රශ්නයක් වූ අතර ව්‍යාපාර ක්‍රියාවලීන්, අභ්‍යන්තර පාලනයන් සහ තොරතුරු තාක්ෂණ පාලන පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. දී ඇති තත්ත්වයට අනුව අයදුම්කරුවන් විසින් අභ්‍යන්තර පාලන පද්ධතියේ දුර්වලතා හා ප්‍රතිලාභ හඳුනා ගැනීම අපේක්ෂා කරයි.

**(a) කොටස**

**සීමාසහිත මාලක පුද්ගලික සමාගම** විසින් නිසි පරිදි සැලසුම් නොකළ පාලන ක්‍රියාකාරකම් වල මූලිකාංග 3ක් එක් එක් දුර්වලතා සඳහා උදාහරණ සහිතව හඳුනාගැනීම අවශ්‍ය වේ. බොහෝ අපේක්ෂකයින් පාලන ක්‍රියාකාරකම් වල අදාල මූලිකාංග හඳුනා නොගෙන උදාහරණ ලබා දී තිබුණි. එයට හේතුව අභ්‍යන්තර පාලනයට අදාල න්‍යායික කරුණු පිළිබඳ අපේක්ෂකයන් තුළ වූ දුර්වල දැනුමයි.

**(b) කොටස**

**(a) කොටසින්** හඳුනාගත් දුර්වලතා මගහරවා ගැනීම සඳහා නිර්දේශ සඳහන් කරන ලෙස මෙම කොටසින් ඉල්ලා ඇත. පාලන ක්‍රියාකාරකම් වල මූලිකාංග හඳුනාගත් අයදුම්කරුවන් මෙම කොටසට සාර්ථකව පිළිතුරු සපයා ඉහළ ලකුණු ලබාගෙන තිබුණි.

**කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.**

**(c) කොටස**

මෙම කොටස මගින් අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිලාභ 3 ක් පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටී. ස්ව-අධ්‍යයන පාඩම් මාලාවේ සවිස්තරාත්මක පැහැදිලි කිරීම් සමඟ ප්‍රතිලාභ ගණනාවක් සඳහන්ව ඇත.

බොහෝ අයදුම්කරුවන් සාමාන්‍ය වාසි දක්වා තිබූ අතර සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට අසමත් වුහ. සමහර අපේක්ෂකයන් කරුණු නිවැරදිව සඳහන් කර තිබූ නමුත් වෙනත් අදහසක් විස්තර කර තිබුණි. එසේම ඇතැම් අයදුම්කරුවන් සුහදතාවය වැඩි කිරීම, විනිවිදභාවය, සේවක ආරවුල් විසඳීම, සේවක විනය වැනි අදාල නොවන පිළිතුරු පැහැදිලි කර තිබුණි.

සෑම වසරකම සැලකිය යුතු ලකුණු ප්‍රතිශතයක් වෙන් කෙරෙන, ස්වයං අධ්‍යයනය පාඩම් මාලාවේ වැඩි බරතැබීමක් සහිත මෙම පරිච්ඡේදය ප්‍රමාණවත් අවධානයක් යොමු කරන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දිය හැක.

**කාර්යසාධන මට්ටම සාමාන්‍ය මට්ටමක පැවතුණි.**

**(d) කොටස**

වැටුප් පද්ධතියක වැටුප් ක්‍රියාවලියේ පියවර සඳහන් කිරීම අවශ්‍ය විය. කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමක විය. මෙය ලකුණු ලබා ගැනීමට පහසු ප්‍රශ්නයකි.

කෙසේවෙතත් බොහෝ අපේක්ෂකයින් වැටුප් ක්‍රියාවලියේ පියවරයන්, පැමිණීම වාර්තා කිරීම, ගෙවීම් සිදු කිරීම ලෙස කිසිඳු පිළිවෙළකින් තොරව සඳහන් කර තිබුණි.

ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් වැටුප් ක්‍රියාවලියේ පියවර පිළිවෙළට සඳහන් කර සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

**(e) කොටස**

පරිගණක වැඩසටහන් වල අනවසර වෙනස්කිරීම්, වැලැක්වීම හෝ හඳුනාගැනීම සඳහා සහ දත්ත ගොනුවලට අනවසර සංශෝධන වැලැක්වීම සඳහා ස්ථාපිත කළ හැකි පාලනයන් ලැයිස්තුගත කිරීම මෙම කොටසින් අපේක්ෂා විය. කාර්යසාධනය සාමාන්‍ය මට්ටමේ විය. සමහර අපේක්ෂකයන් පහත පරිදි අදාල නොවන පිළිතුරු සපයා තිබුණි.

- යෙදවුම් පාලනයන්
- නිමවුම් පාලනයන්
- ක්‍රියාවලි පාලනයන්

සමහර අයදුම්කරුවන් දත්ත ගොනු හෝ වැඩසටහන් වෙත යොමු නොකර පාලනයන් සඳහන් කර තිබුණි. මෙය අයදුම්කරුවන්ගේ පරිගණක පාලනයන් පිළිබඳ දුර්වල දැනුම පෙන්නුම් කල අතර ලකුණු වෙන් නොකරන ලදී.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 09

මෙයද ලකුණු 25ක් වෙන් කළ සිද්ධි අධ්‍යයන මත පදනම් වූ ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය මඟින් අයදුම්කරුවන්ගේ පහත ක්ෂේත්‍ර පිළිබඳව දැනුම පරීක්ෂා කර ඇත.

1. අවදානම් සහිත කලාප හඳුනාගැනීම සඳහා විශ්ලේෂණ ක්‍රියා පටිපාටි යෙදීම.
2. විගණන සාක්ෂි එකතු කිරීම සඳහා යොදා ගතහැකි ක්‍රියා පටිපාටි වර්ග.
3. දේපල, පිරියත සහ උපකරණ හා සම්බන්ධිත පාර්ශව සමග ගනුදෙනුවලට අදාලව විගණන ක්‍රියාවලි සිදු කිරීම.
4. විගණක වාර්තාවේ කරුණක් අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුලත් කිරීම සිදු කරනු ලබන අවස්ථාවන්.

**(a) කොටස**

මෙම කොටස විගණන ක්‍රියා පටිපාටි සිදු කිරීමේ විශේෂ අවධානයක් යොමු කල යුතු ක්ෂේත්‍ර හඳුනාගැනීම පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කරනු ලබයි.

කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවති අතර බොහෝ අපේක්ෂකයින් වැඩිදුර විගණන සාක්ෂි සහ විමසීම් සිදු කිරීමට අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනාගෙන තිබුණි. කෙසේවෙතත්, ප්‍රශ්නයේ අවශ්‍යතාවය හඳුනාගැනීමට නොහැකි වූ අයදුම්කරුවන් සුළු පිරිසක් අදාල නොවන පිළිතුරු ලබා දී තිබුණි.

ඔවුන් පහත පරිදි අදාල නොවන පිළිතුරු සපයා තිබුණි:

- සියළුම ණයගැතියන්ගේ නම්
- අභ්‍යන්තර පාලන දුර්වලතා
- COVID-19 බලපෑම

**(b) කොටස**

විගණන විමසීම් හැර විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා භාවිතා කල හැකි විගණන ක්‍රියා පටිපාටි 3 ක් උදාහරණයක් සමග සඳහන් කිරීම මෙම කොටසින් බලාපොරොත්තු විය. සමහර අපේක්ෂකයන් විගණන විමසීම් විගණන ක්‍රියා පටිපාටියක් ලෙස නැවත සඳහන් කර තිබූ අතර ඒ සඳහා ලකුණු ලබා නොගත්හ. එසේම, මෙමගින් අයදුම්කරුවන්ගේ ප්‍රශ්නය අවබෝධ කර ගැනීම පිළිබඳ දුර්වලතා පෙන්නුම් කෙරේ. මෙයට හේතුව, ප්‍රමාණවත් අවධානයකින් ප්‍රශ්නය කියවා නොතිබීමයි.

තවද, බොහෝ අයදුම්කරුවන් ඔවුන් සඳහන් කළ ක්‍රියාපටිපාටි සඳහා නිවැරදි උදාහරණ දක්වා නොතිබිණි. මෙයට හේතුව, අපේක්ෂකයින්ගේ විගණනය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් නොමැති වීම විය හැකිය.

**(c) සහ (d) කොටස**

යෝග්‍ය විගණන මතයක් ප්‍රකාශ කිරීමට විගණකවරයා සාක්ෂි ලබාගන්නේ කෙසේද යන්න පිළිබඳ අපේක්ෂකයන් ගේ දැනුම මෙම කොටස් දෙක මගින් පරීක්ෂා කරන ලදී. මෙවැනි ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී විගණනය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් වැඩි වටිනාකමක් එකතු කරයි. කෙසේ වෙතත්, ස්ව-අධ්‍යයන පාඩම් මාලාව අධ්‍යයනය කිරීමෙන් දැනුම ලබා කාර්ය සාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි.

**කාර්යසාධන මට්ටම සතුටුදායක මට්ටමක පැවතුණි.**

සමහර අයදුම්කරුවන් පරීක්ෂා කිරීම, නිරීක්ෂණය, තක්සේරු කිරීම වැනි විගණන ක්‍රියා පටිපාටි වර්ග සඳහන් කර තිබුණි. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් දේපල, පිරියත හා උපකරණ විගණනයේ ක්ෂය වීම් ගැන පමණක් සාකච්ඡා කර තිබුණි. (ක්ෂය අනුපාතය, ගණනය කිරීමේ නිවැරදිතාවය, ගණනය කිරීමේ ක්‍රමය, වාර්තා කිරීම අදිය)

**දුර්වල කාර්යසාධනය සඳහා ප්‍රධාන හේතුව ප්‍රායෝගික අත්දැකීම් නොමැති වීමයි.**

**(e) කොටස**

කරුණක් අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුලත් කිරීම අවශ්‍ය යැයි විගණන විසින් සලකා බලනු ලබන අවස්ථාවන් සඳහා උදාහරණ පැහැදිලි කිරීම මෙම කොටසින් අවශ්‍ය වේ. මෙම ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධයක් නොමැතිකම නිසා බොහෝ අයදුම්කරුවන් ප්‍රමාණයක් මෙම කොටසට පිළිතුරු සපයා නොතිබුණි.

පහත සඳහන් අවස්ථාවන්, කරුණක් අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුලත් කල යුතු අවස්ථාවන්ට උදාහරණ ලෙස දක්වා තිබුණ:

- විශේෂිත විගණන ක්ත්‍රෙ පිළිබඳ මූලික අවබෝධයක් ලබා දීම.
- කළමණාකරණය විසින් විෂය පථය සීමා කිරීම.
- ආයතනයට පාලන කල නොහැකි තත්ත්වයන්.

විගණකවරයා විසින් විකරණය කරන ලද මතයක් ප්‍රකාශ කරන අවස්ථා සහ එය විගණක වාර්තාවේ ඉදිරිපත් කරන ආකාරය පිළිබඳව අපේක්ෂකයන් තම දැනුම වැඩිකර ගත යුතුය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය යහපත් විය.**

- - -

**<u>විභාගයේදී උත්තර ලිවීමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා</u>:**

- අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත අධ්‍යයනය කොට එහි අන්තර්ගතය මනාව වටහාගත යුතුය.
- විගණන විෂයට සම්බන්ධ ලිපි, පොත්පත්, සඟරා, ආදිය පරිශීලනය කළ යුතුය.
- ප්‍රශ්න පත්‍රයට අමුණා ඇති "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" පිළිබඳ නිර්වචන හරිහැටි තේරුම්ගෙන එපරිදි උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යුතුය.
- පසුගිය ප්‍රශ්නපත්‍ර වල අන්තර්ගත දැ අධ්‍යයනය කර, යටත් පිරිසෙයින් ඉකුත් විභාගවල ප්‍රශ්නවලටවත් උත්තර ලිවීමට පුරුදු වී, ප්‍රශ්න දී තිබෙන ආකාරය වටහා ගැනීමට උත්සාහ කළ යුතුය.
- ප්‍රශ්න පත්‍ර වල පරීක්ෂා කර ඇති න්‍යායාත්මක කරුණු යොදා ගැනීම විභාගයේදී පරීක්ෂක විසින් අපේක්ෂා කර ඇත්තේ කෙසේද යන සම්බන්ධතාවය අයදුම්කරුවන් වටහාගත යුතුය.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ කවර ක්ෂේත්‍රවලින් පසුගිය ප්‍රශ්න දී තිබේදැයි කෙටි සටහන් ලියාගැනීම මඟින් අයදුම්කරුවන් තේරුම්ගත යුතුය.
- ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට කාලය වෙන්කරගෙන ඒ අනුව උත්තර ලියා පුරුදු වීමෙන් විභාගයේදී අයදුම්කරුවන්ගේ කාල කළමනාකරණය දියුණු වනු ඇත.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ එක් එක් පරිච්ඡේදය සඳහා කෙටි සටහන් පිළියෙල කරගෙන විවේක ලැබෙන විධියට විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු මතකයට නගා ගැනීම සිදුකළ යුතුය.
- අයදුම්කරුවන් කියවීමට හැකි ආකාරයෙන් අත්අකුරු පැහැදිලිව විභාගයේදී ලිවිය යුතුය.
- ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම පටන්ගැනීමට පෙර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරිව කියවා බැලිය යුතුය.
- ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගැනීමටත්, ඒවාට අවශ්‍යකරන යෝග්‍ය උත්තර නිවැරදිව ලිවීමටත් පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් අයදුම්කරුවන් සතුවිය යුතුය.
- වෙන්කර ඇති ලකුණු මත පදනම්ව, ප්‍රශ්නවලට කාලය වෙන්කර ගැනීමෙන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති ප්‍රශ්න වලට ඵලදායී අන්දමින් උත්තර සැපයීමට අයදුම්කරුවන්ට හැකිවනු ඇත.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති ආකාරයටම උත්තරවලද යෝග්‍ය පරිදි නිවැරදි ලෙස අංක යෙදිය යුතුය.
- න්‍යායයන් හා ඒවා ප්‍රශ්නයට යොදාගැනීම අතර සම්බන්ධය වටහා ගැනීම ඉතාමත් වැදගත්වන අතර, ඉල්ලා ඇති අවස්ථාවන්හි උදාහරණ සහිතව ලිවිය යුතුය.
- උත්තර පොත් බාර දීමට පෙර, අවශ්‍ය කරන ප්‍රශ්න සියල්ලටම උත්තර ලියා තිබේද, යෝග්‍ය පරිදි අංක යොදා තිබේදැයි දෙවරක් පරීක්ෂා කර බලන්න.

- * * * -